**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2024 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

## A - කොටස

ව්‍යාපාර නීතිය ප්‍රශ්න පත්‍රය **A, B** සහ **C** යනුවෙන් කොටස් තුනකින් යුක්තව ප්‍රශ්න 07 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන්ගේ ව්‍යාපාර නීති දැනුම සමස්තයක් ලෙස තක්සේරු කිරීමට මෙම ප්‍රශ්න පත්‍රය සකසා ඇත.

ඇගයීම් ක්‍රියාවලියේ නිරීක්ෂණ පහත සාරාංශගත කොට ඇත:

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය වාස්තවික ප්‍රශ්න 14 කින් සමන්විත වූ අතර ව්‍යාපාර නීතිය විෂය ධාරාවේ සියලුම කොටස් ආවරණය වන ආකාරයට ප්‍රශ්න ඉදිරිපත් කොට තිබුණි. අනු ප්‍රශ්න 14 ක් සඳහා මුළු ලකුණු 25 ක් හිමිවිය. සමස්තයක් ලෙස අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

ප්‍රශ්න අංක **1.1, 1.2** සහ **1.3** සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. ප්‍රශ්න අංක **1.2** සඳහා ඇතැම් අයදුම්කරුවන් “අභියාචනාධිකරණය” ලෙස වැරදි පිළිතුරු සපයා තිබුණි. ප්‍රශ්න අංක **1.3** සඳහා “නීතිය මඟින් නීත්‍යානුකූලව බලාත්මක කළ හැක්කේ ලිඛිත ගිවිසුම් පමණි." යන වැරදි වරණය ඇතැම් අපේක්ෂකයන් විසින් තෝරාගෙන තිබුණි. ප්‍රශ්න අංක **1.4, 1.5, 1.6, 1.7, 1.8** සහ **1.9** සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

කෙසේ නමුත් ප්‍රශ්න අංක **1.11** දී බහුතරයක් අයදුම්කරුවන් “සිවිල් නීතිය” හා “අපරාධ නීතිය” අතර වෙනස හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත. එසේම මුදල් විශුද්ධිකරණ පනතේ අරමුණු හා සම්බන්ධිත ප්‍රශ්න අංක **1.12** ට පිළිතුරු සැපයීමට උත්සහ දරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් අතලොස්සක් පමණි. එසේම බහුතරයක් අයදුම්කරුවන් අන්තර්ජාතික වෙළඳ ආරවුල් සම්බන්ධිත අධිකරණමය නොවන ආරවුල් විසඳීමේ ක්‍රම පිළිබඳව නොදැනුවත් බව පෙනී යයි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

සමස්තයක් ලෙස අපේක්ෂකයන් විසින් මෙම ප්‍රශ්නයට සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නය මඟින් රක්ෂණ නීතියේ මූලධර්ම පිළිබඳව පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්නය සඳහා පිළිතුරු සාමාන්‍ය සාර්ථක පිළිතුරු විය.

**(a)** කෙසේ නමුත්, “රක්ෂණ හිමිකම” මූලධර්මය පිළිබඳ සැලකිය යුතු අපේක්ෂකයන් සංඛ්‍යාවකට අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය.

**(b)** තවදුරටත්, “දායකත්ව” මූලධර්මය පැහැදිළි කිරීමට බහුතරයක් අපේක්ෂකයන් අපොහොසත් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය නියෝජ්‍යත්ව නීතිය පිළිබඳ දැනුම, විශේෂයෙන් නියෝජිතයකුගේ යුතුකම් පිළිබඳව පරීක්ෂා කොට ඇත. සමස්තයක් ලෙස, මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

**(a)** නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් ඇති කර ගන්නේ කෙසේද යන්නට අපේක්ෂකයින්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුරු ලබා දී ඇත. ඒ පිළිබඳව අපේක්ෂකයන්ට හොඳ අවබෝධයක් තිබුණි.

**(b)** අයදුම්කරුවන්ට නියෝජිතයෙකුගේ යුතුකම් පිළිබඳව හොඳ අවබෝධයක් තිබුණද, සාධනීය ලකුණක් ලබා ගැනීම සඳහා සවිස්තරාත්මක පිළිතුරක් ලිවීමේ හැකියාව ඔවුන් සතු නොවීය.

**(c)** නියෝජිතයකු ප්‍රධානියාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. **හක්තිට** සිදු වූ අලාභය අයකරගත හැකි බවට අපේක්ෂකයින් විශාල පිරිසක් පැහැදිලි පිළිතුරක් ලබාදී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු ලබා දී ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට ඇතැම් අපේක්ෂකයින් උත්සාහ කර නොතිබුණි.

මෙම ප්‍රශ්නය පාරිභෝගික කටයුතු අධිකාරී පනත සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම තක්සේරු කිරීම සඳහා සකස් කරන ලද්දකි.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු ලබා දී ඇත. අපේක්ෂකයින් කිහිප දෙනෙකු මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට උත්සාහ කර නොතිබුණි. පනතේ දක්වා ඇති පරිදි අරමුණු ලියා තිබුණේ අපේක්ෂකයින් අතළොස්සක් පමණි.

අනවශ්‍ය බඩු තොග ගබඩා කිරීම පාරිභෝගික කටයුතු අධිකාරී පනත යටතේ හඳුනාගෙන ඇති වරදක් බව ඇතැම් අපේක්ෂකයින් අවබෝධකොටගෙන නැත. මෙම ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් ලිවීමට ඔවුන් අපොහොසත් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

පළමු කොටස සඳහා අපේක්ෂකයන් ඉතා අසාර්ථක ලෙස පිළිතුරු ලබා දී ඇත. නීතිමය පුද්ගලභාවය සහ සංස්ථාපනය කිරීම හා සම්බන්ධිත සංකල්ප සම්බන්ධයෙන් අපේක්ෂකයින්ට න්‍යායාත්මක දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය. වැරදි පිළිතුරු ගණනාවක් ලබා දී ඇත. අධිකරණ විසින් සංස්ථාපිත පුද්ගලභාවයේ සළුව ඉවත් කරන අවස්ථා ගැන අපේක්ෂකයන්ට අවබෝධයක් නොතිබුණි. නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයන් කිහිප දෙනෙකු පමණි.

දෙවන කොටසට බහුතරයක් අයදුම්කරුවන් විසින් සාර්ථකව පිළිතුරු ලබා දී ඇත. කෙසේනමුත් ඇතැම් අයදුම්කරුවන් බැංකුවේ වගකීම සඳහන් කරමින් පිළිතුර ලියා නොතිබුණි. ඒ වෙනුවට ඔවුන් එය බැංකුවෙන් මුදල් කළ නොහැකි බව පමණක් දක්වා තිබේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය කම්කරු නීතිය මත පදනම් වූවකි. මෙහි පළමු කොටසට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන්ට ඇය සේවකයෙක්ද නැතිනම් ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙක්ද යන්න අදාල පරීක්ෂණ වලට අනුව තීරණය කළ යුතුව තිබුණි. කෙසේනමුත් බොහෝ අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ ඇය සේවකයෙක් නොවන බවයි. එම නිගමනයට එළඹ ඇත්තේ අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම භාවිතා කරමිනි. මෙම කොටසට පිළිතුරු දීමේදී අදාළ පරීක්ෂණ අදාළ කරගෙන පිළිතුරු සපයා තිබුණේ කිහිප දෙනෙකු පමණි.

දෙවන කොටස සම්බන්ධයෙන්, අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු ලබා දී තිබුණද ප්‍රශ්නගත විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇතැම් අපේක්ෂකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

එසේම ඇතැම් අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ වෙනුවට පාරිතෝෂික දීමනා පිළිබඳව පැහැදිලි කර ඇති බවද නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

# <u>C කොටස</u>

## ප්‍රශ්න අංක 07

**<u>(A) කොටස</u>**

**(a)** අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණි. සමස්තයක් වශයෙන්, ප්‍රශ්නයේ මෙම කොටස සඳහා අපේක්ෂකයින්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.

**(b)** අයදුම්කරුවන් කිහිප දෙනෙක් මෙම කොටසට නිවැරදිව පිළිතුරු දුන්හ. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. භාණ්ඩවල අයිතිය පැවරීම පිළතුරෙහි සඳහන් කොට තිබුණේ අපේක්ෂකයින් කිහිප දෙනෙකු පමණි. සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

**(c)** මෙම කොටස භාණ්ඩ විකිණීමේ ආඥාපනත යටතේ පදනම් වූවකි. ව්‍යංග කොන්දේසි පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර මෙම කොටස සඳහා අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු ලබා දී තිබුණි. නමුත් විනිශ්චිත නඩු තීන්දු සහ පනතේ 14 වැනි වගන්තිය සඳහන් කරමින් පිළිතුරු ලබාදී තිබුණේ අපේක්ෂකයින් කිහිප දෙනෙකු පමණි. සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.

**<u>(B) කොටස</u>**

**(a)** මෙම කොටස ගිවිසුම් නීතියට සම්බන්ධිත වේ. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් ගිවිසුම් සබඳතාව නිවැරදිව හඳුනාගෙන තිබුණි. බාල වයස්කරුවෙකුට ගිවිසුම්වලට එළැඹීමේ හැකියාව ගැන අපේක්ෂකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් කරුණු දක්වා තිබුණි. ඇතැම් අපේක්ෂකයන් බාලවයස්කරුවන්ට ඇති ගිවිසුම්මය ප්‍රතිලාභ දක්වා තිබුණි. විනිශ්චිත නඩු තීන්දු දක්වා තිබුණේ ඉතා සුළු අපේක්ෂකයන් සංඛ්‍යාවක් පමණි. බාලවයස්කරුවන්ට ප්‍රතිලාභ ලබා දෙන ගිවිසුම් මගින් බාලවයස්කරුවන් බැඳී සිටින බව තේරුම් ගෙන තිබුණේ ඉතා සුළු අපේක්ෂකයින් පමණි. සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

**(b)** සමස්තයක් වශයෙන් මෙම කොටස සඳහා පිළිතුරු ඉතාමත් අසාර්ථක විය. ව්‍යාතිරේක පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් දුර්වල මට්ටමක විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණු:</u>**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -